**#mediaethicsSL #SinhalaPress #TamilPress #lka #Mawbima #Lankadeepa #Lakbima #Divaina #Ada #Rivira #Thinakaran #Thinakkural #Sudar Oli**
**#February28**

පසුගිය දිනකදී අම්පාර ප්‍රදේශයේදී සිදුවූ යම් සිදුවීමක් මුල් කරගනිමින් එක් පිරිසක් විසින් තවත් පිරිසකට එල්ල කළ ප්‍රහාරයක් පිළිබඳව මුද්‍රිත මාධ්‍ය ඔස්සේ මෙන්ම ඩිජිටල් මාධ්‍ය ඔස්සේද වාර්තා වුණි. මෙහිදී අපට නිරීක්ෂණය කිරීමට හැකිවූයේ මෙම යම් යම් පුවත්පත් වාර්තාවන් මගින්ද වක්‍රාකාරයෙන් මෙය වාර්ගික ගැටුමක් බවට පත්වීම සඳහා ඉන්ධන ලැබී තිබුණු බවයි.
මෙවැනි ප්‍රවෘත්තියක් වාර්තා කිරීමේදී පුවත්පත් විශේෂයෙන්ම සැලකිලිමත් විය යුත්තේත්, නිවැරදි මූලාශ්‍ර ඔස්සේ නිවැරදිව පුවත ඉදිරිපත් කළ යුත්තේත්, මෙය වාර්ගිකව සංවේදී වන සිදුවීමක් කරා විකාශනය වීමට ඇති ඉඩකඩ නිසාවෙන් බවද මෙහිදී දැක්විය යුතුවේ.

උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම් දිවයින මගින් මෙම සිදුවීම වාර්තා කර ඇති ආකාරය සැලකිල්ලට ගත හැක. එහිදී සිරස්තලය තුළ පැවසෙන්නේ "අම්පාරේ හෝටලයක මස් හොද්දට මිනිස් ශරීරයට අහිතකර පෙති වර්ගයක් කලවම් කරලා" යනුවෙනි. එනමුත් ප්‍රවෘත්තිය තුළදී එසේ තිබුණේ පෙති වර්ගයක්ද නැද්ද යන්න නිශ්චිත නොවූ බව හැඟවේ. එසේම මෙහි සාම්පලයක් රජයේ රස පරීක්ෂකට යවා ඇති බවද පැවසේ. එසේ නම් රස පරීක්ෂක වාර්තාව පැමිණීමටත් කලින් එය මිනිස් සිරුරට අහිතකර පෙති වර්ගයක් බව දිවයින වාර්තාකරු පවසන්නේ කෙසේද?

මෙම පෙති වර්ගයක් යන සඳහන සියලුම පුවත්පත් තුළ පාහේ සඳහන් වූ නමුත්, ඒ සඳහා අද පුවත්පත හැර වෙනත් එකදු පුවත්පතක් හෝ මූලාශ්‍රයන් සඳහන් කර නොමැත. එසේම යම් යම් දමිළ පුවත්පත් මගින් සියුම්ව මෙය වර්ගවාදී ප්‍රහාරයක්ය යන්න ඉස්මතු කර ඇති අතර, සුඩර් ඔලි පුවත්පත මගින් සෘජුවම මෙම පුවතට වර්ගවාදී වර්ණයක් ලබාදී ඇත.

මෙවැනි පුවතක් වාර්තා කිරීමේදී වැදගත් වන්නේ මනා සංයමයකින් යුතුව ගැටළුව සංසිඳෙන ලෙසින් මනාව නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින්, මාධ්‍ය ආචාර ධර්ම අනුකූල වාර්තාකරණයක් යොදාගැනීමද? එසේත් නැතිනම් ආගමික හෝ වාර්ගික හැඟීම් අවුස්සමින්, කුපිත කරවන ආකාරයේ, නිවැරදි මූලාශ්‍ර නොමැති වාර්තාකරණයක් ඉදිරිපත් කිරීමද? අප නගනා පැනය එයයි.